**UNIVERSITY OF PERADENIYA**
**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**

**ශාස්ත්‍රවේදී උපාධි (බාහිර - නව නිර්දේශය) පරීක්ෂණය 300 මට්ටම - 2023**
**இன கலைத்தேர்வு பரீட்சை (வெளிவாரி-புதிய பாடத்திட்டம்)300 மட்டம் -2023**

**Bachelor of Arts (External-New Syllabus) Examination 300 Level - 2023**
**(ECNE 302: සංවර්ධන ආර්ථික විද්‍යාව)**

උපදෙස් :
1. මෙම ප්‍රශ්න පත්‍රයෙහි අඩංගු ප්‍රශ්න සංඛ්‍යාව 07 කි. ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න
2. නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු කපනු ලැබේ
3. කාලය පැය තුනක් (03) පමණයි

---

1. a. සංවර්ධනය පිළිබඳ සංකල්ප සහ න්‍යායන් වල පරිණාමය පැහැදිලි කරන්න. (ලකුණු 12)
   b. සංවර්ධනය වෙමින් පවතින රටවල් මුහුණදී තිබෙන ප්‍රධාන සංවර්ධන ගැටළු මොනවාද? ඔබගේ පිළිතුර කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

2. "සංවර්ධනය වෙමින් පවතින රටවල සීඝ්‍ර ආර්ථික වෘධියක් සඳහා ආර්ථික සහ සමාජ පරිවර්තනයන් වැදගත්වේ". ශ්‍රී ලංකාව ආශ්‍රයෙන් දැක්විය හැකි සුදුසු උදාහරණ සහිතව මෙම ප්‍රකාශය විස්තර කරන්න. (ලකුණු 20)

3. a. සංවර්ධනය වෙමින් පවතින රටවල ග්‍රාමීය සහ නාගරික ශ්‍රම වෙළඳපලවල දැකියහැකි මූලික ලක්ෂණවල වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 10)
   b. සංවර්ධනය වෙමින් පවතින රටවල පවතින විවිධ සේවාවියුක්ත වර්ගයන් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

4. a. අසමානතාව, දරිද්‍රතාවය සහ ආර්ථික සංවර්ධනය අතර සම්බන්ධතාව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)
   b. ආදායම් අසමානතාව මැනීමේ විවිධ මිණුම් පැහැදිලි කරන්න. (ලකුණු 06)
   c. සංවර්ධනය වෙමින් පවතින රටවල රජයන්ට දරිද්‍රතාව පිටුදැකීම සඳහා ක්‍රියාත්මක කලහැකි ප්‍රතිපත්තිමය විකල්පයන් මොනවාද? ඔබගේ පිළිතුර කෙටියෙන් දක්වන්න. (ලකුණු 06)

5. a. ජනගහන වර්ධනය සහ ආර්ථික සංවර්ධනය අතර පවතින සම්බන්ධතාව පිළිබඳව සංවර්ධන ආර්ථික විද්‍යාඥයින් විසින් ඉදිරිපත් කර ඇති විවිධ අදහස් පැහැදිලි කරන්න. (ලකුණු 12)
   b. සංවර්ධනය වෙමින් පවතින රටවල ආර්ථික සංවර්ධනය තීව්‍ර කිරීම සඳහා සෞඛ්‍ය සහ අධ්‍යාපනයෙහි කාර්යභාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

6. a. සංවර්ධනය වෙමින් පවතින රටවල ආර්ථික සංවර්ධනය සඳහා කෘෂිකර්මාන්තය වැදගත් අංශයක් ලෙස සලකන්නේ ඇයි? ඔබගේ පිළිතුර කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)
   b. ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්වය දියුණු කිරීමෙහිලා සංවර්ධනය වෙමින් පවතින රටවල් මුහුණදී තිබෙන ප්‍රධාන ගැටළු විස්තර කරන්න. (ලකුණු 06)
   c. සංවර්ධනය වෙමින් පවතින රටවල කෘෂි අංශය දියුණුකිරීම සඳහා රජයන් හා ඒකාබද්ධව ක්‍රියාත්මක කලහැකි ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග මොනවාදැයි පෙන්නුම් කරන්න. (ලකුණු 06)

7. පහත දැක්වෙන ඕනෑම සංකල්ප **යුගල දෙකක්** තෝරාගෙන එම සංකල්ප යුගල අතර පවතින සම්බන්ධතාව පැහැදිලිව විස්තර කරන්න.

a. ඉතුරුම්, ආයෝජන සහ ආර්ථික වෘධිය
b. ඉඩම් ප්‍රතිසංස්කරණ සහ ග්‍රාමීය සංවර්ධනය
c. ජනගහන වර්ධනය, දරිද්‍රතාවය සහ සංවර්ධනය
d. අධ්‍යාපනය, පුහුණුවක් ලබාගැනීම සහ ශ්‍රම ඉල්ලුම
e. පරිසරය සහ සංවර්ධනය

(එක් කොටසකට ලකුණු 10 බැගින්)

****************************************